මගේ අංකය :- අධිසේකොස/කඩඉම්(පැරණි)/2021

සියලුම,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්/මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් /අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ භාෂණ පරිවර්තක සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)**

අංක 224/15 හා 1982 දෙසැම්බර් මස 23 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ II වන කොටසේ 09 වන වගන්තියේ (1) (ඉ) උපවගන්තියට සහ කලින් කලට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද සංශෝධන හා 1990.05.29 දිනැති කොමිෂන් සභාවේ තීරණයට අනුකූලව සහ " ක " පරිශිෂ්ඨයෙහි 8 වන වගන්තියේ සඳහන් පරිදි ඉහත සඳහන් විභාගය කොළඹදී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ❖ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ භාෂණ පරිවර්තක සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් මෙම විභාගය සඳහා පෙනී සිටිමට සුදුස්සෝ වෙති.

02. විභාග පටිපාටිය: අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙම විභාගය සඳහා පහත සඳහන් විෂයන් නියම කර ඇති අතර, එය අ.පො.ස.(සා.පෙළ) විභාග මට්ටමට සමාන වනු ඇත. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය දෙකකි.

I. සිංහල භාෂාව දෙමළ භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරිම.

II. දෙමළ භාෂාව සිංහල භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරිම.

III. ඉංග්‍රීසි භාෂාව සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට පරිවර්තනය කිරිම.

අයදුම්කරුවන් අනිවාර්යයෙන්ම මින් විෂයන් දෙකකට ඉදිරිපත් වී සමත් විය යුතුව ඇත. ඔවුන්ගේ අභිමතය පරිදි එම විෂයන් දෙක තෝරා ගැනීම සඳහා ඉඩ දෙනු ලැබේ.

03. පහත 04 වන ඡේදයේ සඳහන් කොන්දේසි වලට යටත්ව අයදුම්කරුවන්ගේ අභිමතය පරිදි මෙම විභාගයේ විෂයන් සඳහා එකම වරකදී හෝ වෙන් වෙන් වාර වලදී පෙනී සිටිය හැක.

04. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250/- ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම් කර ඉදිරිපත් නොවූ නිලධරයන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම් කළ යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

05. මෙම විභාග ගාස්තු **" අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් "** නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයෙන් වෙන් කර ගැනීමට හැකිවන පරිදි අමුණා එවිය යුතුය.

06. මේ සමග ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ X 8 ½ ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධරයන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග 2021 මැයි මස 28 වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " අධිකරණ භාෂණ පරිවර්තක සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වූ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 " (පැරණි ව්‍යවස්ථාව අනුව) " යනුවෙන් සඳහන් කළ යුතුය.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒ සමග එවා ඇති විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

08. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධාරින්ට දැන්වීමට කටයුතු කරන්න.

සටහන :- **2018.09.11** දිනැති උපලේඛනගත රජයේ නිලධරයන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ **15.3.2** හා **15.3.3** වගන්ති පහත පරිදි වේ.

**15.3.2 "මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාව යටතේ අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවල II ශ්‍රේණියට අදාල වන පළමු වන හා දෙවන වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කරන ලද නිලධරයන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවන්ට අයත්) II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්/නිදහස් වූවා ලෙස සැලකේ."**

**15.3.3 "නියමිත දිනට පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ නොකරන ලද අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) II වන ශ්‍රේණියේ නිලධරයන්ට පැරණි ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටීම සඳහා නියමිත දින සිට වසර තුනක සහන කාලයක් ලබා දෙනු ලැබේ. එම කාලය තුළ අදාල පළමු වන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙක සමත් වී/නිදහස් වී සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වන නිලධරයන් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් හෝ එකී විභාගවල එක් විෂයක් හෝ විෂයයන් කීපයක් සමත් වී තිබුණද, මෙම ව්‍යවස්ථාව යටතේ අධිකරණ කළමනාකරණ සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) II වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය."**

**සැ.යු - ඉහත ප්‍රතිපාදන අනුව අධිකරණ භාෂණ පරිවර්තක II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ පෙනී සිටීමට ලබාදුන් වසර තුනක සහන කාලය තුළ පවත්වනු ලබන මෙම විභාගය, ඒ යටතේ පවත්වනු ලබන 2 වන විභාගය බව මෙයින් දන්වනු ලැබේ.**

පී.එම්.ටී.බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්සන් කළේ / එස්.එච්.සෝමරත්න

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2021 අප්‍රේල් මස 28. වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

# SPECIMENT APPLICATION FORM

## First Efficiency Bar Examination for Officers in Grade II of the Court Interpreter's Service of Sri Lanka - 2020

## ( According to the old S.P.O's Service Minute)

01. Name:

1:1 Name with initials Mr./Mrs./Miss:.................................................................................................
(In block capital letters)

1:2 Full Name: ..........................................................................................................................
(In block capital letters)

1:3 Full Name:...........................................................................................................................
(In Sinhala/Tamil)

1:4 National Identity Card Number:.....................................................................................

02. Permanent Address:................................................................................................................
(In block capital letters)

2:1 Permanent Address:..............................................................................................................
(In Sinhala/Tamil)

2:2 Official Address:....................................................................................................................
(In block capital letters)

2:3 Official Address:....................................................................................................................
(In Sinhala/Tamil)

03. Date of Birth: Date ___ Month ___ Year ______

04. Personal File No:- EA/PF/2/..............

05. Please give details of the subjects and the years you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I.<br>II. |
| | I.<br>II. |

06. Subject / Subjects you are now offering to sit for:

(i) ..............................................................................

(ii) ...............................................................................

07. The value of payment made as examination fee:.........................................

I state that the particulars given are accurate and I am entitled to sit for the examination in the medium mentioned in the paragraph 5 above. I certify that I am appearing for the Examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to abide by the rules governing the examination.

........................... ....................................................

Date Signature of the applicant

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss........................................................................................................................
...................................................who is a Grade II Court Interpreter is personally known to me and signed before me on ..................................................

....:............................................

Signature
Date:.....................................................
Name:...................................................
Designation:.........................................
Address:...............................................

---

**Certificate of the Head of the Department**

I Certify that,

01. The particulars furnished above were checked and found to be accurate
02. The officer sits for this examination for the first time / has made the correct payment as Examination fee.
03. The applicant is eligible to sit for this examination

Designation:......................................
Date..................................................

......................................................................

Signature of the Head of the Department